# ආර්ථික චින්තනයේ වර්ධනය උදෙසා මාක්ස්වාදී න්‍යායේ දායකත්වය.

අනූෂා සජීවනී රූබසිංහ


## සංක්ෂේපය

*කාල් මාක්ස්ගේ කොමියුනිස්ට් ප්‍රකාශය යන කෘතියත් හා එංගල්ස්ගේ Das Capital කෘතියත් ඔස්සේ න්‍යායාත්මක පදනම සකසාගත් මාක්ස්වාදී ආර්ථික විග්‍රහය එක් කාලයකදී ලෝකයේ ජනගහනයෙන් තුනෙන් එකක් පිළිගත්තාවූ ආර්ථික ක්‍රමයක් විය. මාක්ස්වාදී න්‍යායේ හරය වන්නේ ධනවාදී අර්බුදකය තුළ පවතින්නා වූ අර්බුදය හේතුවෙන් කම්කරුපන්ති ආන්දෝලනාත්මකත්වය පවතින් සමාජවාදී පාලනයක් බිහිකර ගැනීමට හැකියාව ලැබෙන බවයි. පසු කාලීනව වී. අයි. ලෙනින්, ස්ටාලින්, මාඕ සේතුං වැනි මාක්ස්වාදී න්‍යායකයන් විසින් මෙම ආර්ථික චින්තනයේ පෝෂණයට දායකත්වය සපයනු ලැබූ අතර මාක්ස්වාදී චින්තනය වර්තමානයේදී පවා ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී ඇති කරන්නා වූ බලපෑම අති විශාලය.*


## හැඳින්වීම

ඇඩම් ස්මිත්ගේ "ජාතීන්ගේ ධනය" (An Inquiry into the Nature and Causes of the Wealth of Nations) පසු සැලකියයුතු කාලපරිච්ඡේදයක් තුළ ආර්ථික චින්තනය පිළිබඳ ඒකාධිකාරයක් හිමිකර ගැනීමට රාජ්‍ය නිර්බාධවාදයට හැකියාව ලැබුණි. කාර්මික විප්ලවයේ ආසන්න අවදියේදී පැතිර තිබූ වාණිජවාදය (Mercantilism) වෙනුවට රාජ්‍ය නිර්බාධවාදය සිත් ඇදගන්නා සුළු විකල්පයක් වූ අතර කාර්මික විප්ලවයේ ආර්ථික ප්‍රතිඵල විග්‍රහ කිරීම සඳහා ඇඩම් ස්මිත්ට අනුගත වූ ආර්ථික න්‍යායන් බිහිකිරීමට එම යුගයේ ආර්ථික විද්‍යාඥයන් බොහෝ දෙනෙක් වැඩි කැමැත්තක් දැක්වූහ. රාජ්‍ය නිර්බාධවාදය ඒ ආකාරයෙන්ම නොතෙරෙන ආකාරයේ ආර්ථික මත ඇඩම් ස්මිත්ට පෙර බිහිවී තිබුණි. එසේ වුවද රාජ්‍ය නිර්බාධවාදීන් තර්කාන්විත බව, ප්‍රායෝගිකත්වය හා ආකර්ශනීය බව හමුවේ ඒ සියලු මතවාද යටපත්වන තත්ත්වයක් ඇති විය. වාණිජවාදය අතහැර රාජ්‍ය නිර්බාධවාදය ක්‍රියාත්මක කිරීමට මහා බ්‍රිතාන්‍ය සහ සමහර යුරෝපා රටවල පාලකයන් උත්සුක වීමත් සමග තවත් දශක කීපයක් යනතුරු යුරෝපය තුළ ප්‍රධාන ආර්ථික චින්තනය බවට ධනවාදය පත්ව තිබුණි.

ඇඩම් ස්මිත්ගෙන් පසු තෝමස් රොබට් මෝල්තස් ඩේවිඩ් රිකාඩෝ, ජේ.බී. සියු යනාදී ආර්ථික චින්තකයන් රාජ්‍ය නිර්බාධවාදය ස්ථාපිත කරන සහ තහවුරු කරන ආකාරයේ න්‍යාය ඉදිරිපත් කරනු ලැබිය (Wright, Erick , Levine, Sober, Elliott ,1992). රාජ්‍ය නිර්බාධවාදය ආර්ථික න්‍යාය තුළ මුල් බැසගන්නා තත්ත්වයක් ඇති කරන ලද්දේ සම්භාව්‍ය මුල් විග්‍රහයන් මගිනි. සේගේ (J.B.Say) න්‍යාය එක් අතකින් ආර්ථිකය ස්වයංක්‍රියව සමතුලිතතා මට්ටමට පත්වන බව ප්‍රකාශ කළ අතර මුදල් ප්‍රමාණවාදීන්, මුදල් සැපයුම මුදල් ඉල්ලුමට සමාන වන බවත් මුදල් ප්‍රමාණයේ සිදුවන වෙනස්වීමකට සාපේක්ෂව මිල මට්ටමද වෙනස් වන බවත් ප්‍රකාශ කරන ලදී. ඇඩම් ස්මිත්ගෙන් පසු බිහිවූ මේ සියලු ආර්ථික න්‍යායන්ගෙන් ප්‍රකාශ කිරීමට උත්සාහ කරන ලද්දේ, ආර්ථික අරමුණු ඉටුකරගත හැක්කේත් මිනිසාගේ සමෘද්ධිය ලඟාකර ගත හැක්කේත් රාජ්‍ය නිර්බාධවාදය තුළින්ය යන්නයි.

මාක්ස්වාදී ආර්ථික චින්තනයෙන් සිදුවූ වැදගත්ම සේවාව ලෙස හැදින්විය හැක්කේ ප්‍රථම වරට ධනවාදී ආර්ථික චින්තනයට ප්‍රබල අභියෝගයක් එල්ල කිරීමත් ධනවාදී ක්‍රමයට සම්පූර්ණයෙන්ම විකල්ප වූ ආර්ථික මතවාද ඉදිරිපත් කිරීමටත් එයට හැකිවීමය. 1918 දී ජර්මනියේ උපත ලද මාක්ස් සිය ආර්ථික චින්තනය සකසා ගැනීම සඳහා අපෝහක භෞතිකවාදය මෙන්ම ඩේවිඩ් රිකාඩෝගේ සහ ඇඩම් ස්මිත්ගේ ආර්ථික මතවාද වෙත ද බොහෝ සේ නැඹුරු වූ බව ප්‍රකාශ කෙරේ. මාක්ස්වාදී දර්ශනය ද්වන්ද්වාත්මක භෞතිකවාදය (Dialectical Materialism) අපෝහක භෞතිකවාදය මුල්කරගෙන ගොඩනැගී තිබේ (Muthiah, Wesley s. and Wanasinghe, (ed.) 2004.) 1948 දී ඉදිරිපත් කරන ලද කොමියුනිස්ට් ප්‍රකාශනය මගින් (The Communist Manifesto) ඔහුගේ දේශපාලන සහ ආර්ථික විග්‍රහයට පදනම් වූ න්‍යායාත්මක සංකල්පය ඉදිරිපත් කරනු ලැබීය. ඔහු කොමියුනිස්ට් ප්‍රකාශනය මගින් මූලික කරුණු 3 ක් අවධාරණය කරන ලදි. (රුළිගු, (අනු.) 2002).

ඔහු පෙන්වාදුන් මූලික කාරණය ඉතිහාසය යනු ධනපතීන් සහ කම්කරු පංතිය අතර පංති අරගලයයි. දෙවැනි කාරණය වන්නේ ධනය ප්‍රාග්ධන හිමියන් සිප දෙනෙකු අතර ඒකරාශිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිර්ධන පංතිය වැඩි වන්නේ ය යන්නත් එය විප්ලවයට තුඩු දෙන්නේ ය යන්නත්ය. අවසානයේ දී පංති රහිත සමාජයක් බිහිවන්නේය යන්න ඔහු විසින් පෙන්වා දුන් තුන්වැනි කාරණය වේ. (රුළිගු, (අනු.) 2002). කොමියුනිස්ට් ප්‍රකාශනය, මූලික සංකල්පයට අනුකූල වන අයුරින් හැඩගස්වන ලද මාක්ස්වාදී ආර්ථික විග්‍රහය 1867 දී කාල් මාක්ස් විසින් ප්‍රකාශයට පත් කරන ලද Das Capital කෘතියෙන් ප්‍රකාශයට එළි දක්විය. එය එම කෘතියේ පළමු වෙළුම වූ අතර දෙවැනි සහ තුන්වැනි වෙළුම් ෆෙඩ්රික් ඒංගල්ස් (Friedrich Engels) විසින් සංශෝධනය කරන ලදුව මාක්ස්ගේ මරණයෙන් පසු 1885 සහ 1894 වර්ෂවල දී ප්‍රකාශයට පත් කරන ලදී. මාක්ස්ගේ Das Capital කෘතිය ධනවාදය සහ ප්‍රාග්ධනය පිළිබඳ විශේෂඥතාවකින් යුතුව කරුණු විශ්ලේෂණය කරන ලද ශාස්ත්‍රීය කෘතියක් ලෙස සැලකේ. වටිනාකම පිළිබඳ ශ්‍රම න්‍යාය (Labour theory of value), හීනවන ලාභ අනුපාත න්‍යාය (Decreasing rates of profit), ඉහළ යන වත්කම් පිළිබඳ න්‍යාය (Increasing Concentration of wealth), ආදිය ඔහුගේ ආර්ථික විග්‍රහයේ මූලික අංග වේ (Bronfenbrenner, Sichel, Werner, Gardner ,1984). වටිනාකම පිළිබඳ ශ්‍රම න්‍යාය ඉදිරිපත් කරන ලද්දේ මාක්ස්ට පෙර ජීවත් වූ ඇඩම් ස්මිත් හා ඩේවිඩ් රිකාඩෝ නැමති සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයන් විසිනි. එය පදනම් කරගනිමින් මාක්ස් විසින් ස්වකීය න්‍යාය ගොඩනගා ඇත.

**මාක්ස්ගේ ආර්ථික විග්‍රහය**

මාක්ස් ආර්ථික චින්තනය තුළින් විග්‍රහ කලේ 19 වන සියවසයේ පැවතුණු සමාජයයි. මෙම සමාජය අද පවතින සමාජයෙන් බෙහෙවින් වෙනස් වූ එකකි. එම සමාජ හා ආර්ථික පරිසරයේ

පැවතුන විෂමතා ආශ්‍රයෙන් මාක්ස් සමාජය විග්‍රහ කළේය. කොමියුනිස්ට් ප්‍රකාශනයේ මාක්ස්ගේ දර්ශනය කැටිකර දක්වා තිබේ. ඔහු දක්වන අන්දමට මිනිස් ඉතිහාසය පංති අරගලය පිළිබඳ ඉතිහාසයයි. මාක්ස්ගේ දර්ශනයේ ඉතාමත් වැදගත් අංගය නම් සමාජය පිළිබඳව ඉදිරිපත් කර ඇති ගැටුම් ආකෘතිය (Conflict model)යි. මාක්ස් පෙන්වාදෙන අන්දමට සෑම සමාජයක් ම එම සමාජයෙහි පැවැත්ම සඳහා භාණ්ඩ/සේවා නිපදවිය යුතුය (Bronfenbrenner, Sichel, Werner, Gardner ,1984). මෙසේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය එක් අතකින් පෞද්ගලික අවශ්‍යතාවයක්ද අනෙක් අතින් සමාජමය අවශ්‍යතාවයක්ද වෙයි. භාණ්ඩ හා සේවා සවර හෝ සමාජයක ධනය වෙයි. මෙම භාණ්ඩවලට මිනිසාගේ අවශ්‍යතා තෘප්තිමත් කළහැකි හෙයින් එහි ප්‍රයෝජ්‍ය අගයක් පවතී. මෙම ප්‍රයෝජ්‍ය අගය ලබාගත හැක්කේ කිසියම් පුද්ගලයකු විසින් එය පරිභෝජනය කිරීමෙනි. ඕනෑම භාණ්ඩයක් සම්බන්ධයෙන් ප්‍රයෝජන අගයක් පමණක් නොව විනිමය අගයක් (හුවමාරු අගයක්) ද පවතී. භාණ්ඩයක පවතින මෙම විනිමය අගය කාලය හා ස්ථානය අනුව වෙනස් විය හැකිය. එහි දී ගුණාංග අතින් එකිනෙකට වෙනස් වූ භාණ්ඩ දෙකක් හුවමාරු කරන්නේ ද යන ප්‍රශ්නය මාක්ස් විසින් ඉදිරිපත් කර ඇත. එහිදී ඔහු පෙන්වා දෙන්නේ භාණ්ඩ දෙක සම්බන්ධයෙන් පොදු ගුණාංගය වන්නේ මිනිස් ශ්‍රමය බවත් එය සෑම භාණ්ඩයකටම පොදු වන බවත්ය (Wright, Erick Levine, Sober, Elliott , 1992). මාක්ස්ගේ ආර්ථික විග්‍රහයට අනුව වටිනාකම පිළිබඳ ශ්‍රම න්‍යාය පහත සඳහන් අයුරින් දැක්විය හැකිය.

$$W = C + V + S$$

W= ශ්‍රම පැය ගණන අනුව ගණනය කරන ලද ජාතික ආදායම

C=ස්ථාවරප්‍රාග්ධනය (Constant Capital)

V= විචල්‍ය ප්‍රාග්ධනය ( Variable Capital)

S= අතිරික්ත වටිනාකම (Surplus Value)

මාක්ස්ගේ විග්‍රහයේ දැක්වෙන ස්ථාවර ප්‍රාග්ධනය යන්න ධනවාදී ගිණුම් ක්‍රමයේ දක්වන ලද ස්ථාවර ප්‍රාග්ධනය (Fixed Capital) නොවේ. මාක්ස්ගේ ස්ථාවර ප්‍රාග්ධනයෙන් අමුද්‍රව්‍ය සඳහා යොදාගත් ශ්‍රමය ද යන්ත්‍ර සූත්‍ර ක්ෂයවීම සහ වෙනත් දිගුකාලීන ප්‍රාග්ධන භාණ්ඩවල ක්ෂයවීම් වෙනුවෙන් වැය වූ ශ්‍රම ප්‍රමාණය ද දැක්වේ( Bronfenbrenner, Sichel, Werner, Gardner, Wayland ,1984). විචල්‍ය පිරිවැය යන්නෙන් නිෂ්පාදනයේදී වැය කරන ලද ශ්‍රමය මගින් මිලදී ගැනීමට හැකි භාණ්ඩ ප්‍රමාණයේ වටිනාකමට සමාන වන්නාවූ ශ්‍රම පැය ගණන අදහස් වේ. උදාහරණ ලෙස එක් කම්කරුවකු ඔහුගේ ශ්‍රමය තුළින් නිෂ්පාදන භාණ්ඩයක් නිපදවීම සඳහා පැය 40 ක් වැය කර ඇති නමුදු එමගින් ලබන වැටුපෙන් ඔහුට ලබාගත හැක්කේ වෙනත් කම්කරුවන් විසින් පැය 30 ක ශ්‍රමයක් යොදා නිෂ්පාදනය කරන ලද භාණ්ඩ නම් විචල්‍ය ප්‍රාග්ධනයේ වටිනාකම 30 ක් පමණක් වේ. එසේ නම් අනෙක් කම්කරුවාගේ පැය 10 ට සිදු වූයේ කුමක්ද? මාක්ස් එය අමතක නොකරයි. ඔහු එය අතිරික්ත ශ්‍රමය වශයෙන් හඳුන්වයි. මාක්ස් පෙන්වා දෙන පරිදි එම අතිරික්තය

බිහිවන්නේ ශ්‍රමය තුළිනි. යම්කිසි භාණ්ඩයක වටිනාකම මිනිස ශ්‍රමයෙන් එම වටිනාකම් බිහිවීමේ පදනම විස්තර කළ යුත්තේත් ශ්‍රමය මුල් කරගෙනය යන්න අතිරික්ත ශ්‍රම න්‍යායේ මූලික අදහස වේ. මාක්ස් පෙන්වා දෙන පරිදි මෙහිදී අතිරික්ත ශ්‍රමයේ වටිනාකම් නිෂ්පාදකයා විසින්* රැඳවාගනී. ඔහු එයින් පොලිය, බදු කුලී ආදී සියළුම ගෙවීම් කරන අතර ලාභ ලබා ගනී. මෙහි විචල්‍ය ප්‍රාග්ධනයට සාපේක්ෂව අතිරික්ත වටිනාකමේ අගය කොපමණ වේද? ඉහත උදාහරණයට අනුව එය 10/30 හෝ 1/3 වේ. රුපියල් මිලියන 5000 ක ස්ථාවර ප්‍රාග්ධනයක් රුපියල් මිලියන 3000 ක විචල්‍ය ප්‍රාග්ධනයක් සහ රුපියල් මිලියන 1000ක අතිරික්ත ශ්‍රම වටිනාකමක් සහිත ආර්ථිකයක (W) ජාතික ආදායම රුපියල් මිලියන 1000ක් වේ (Bronfenbrenner, Sichel, Werner, Gardner, Wayland ,1984).

මාක්ස් තමන්ගේ අතිරික්ත ශ්‍රමය පිළිබඳ න්‍යාය පැහැදිලි කරන ලද්දේ ධනවාදී ආර්ථික ක්‍රමය පදනම් වී ඇත්තේ ශ්‍රම සූරාකෑම මතය යන්නයි. Muthiah, Wanasinghe, (ed.),2004). ධනපති නිෂ්පාදකයින් විසින් නිර්ධන පංති කම්කරුවන්ගේ ශ්‍රමයට නියමිත ගෙවීම් ලබා නොදීම මගින් ලාභය උපයීම කරගැනීම සඳහා උත්සාහ කරනු ලබයි. කෙසේ වුවද ධනපති ආර්ථික ක්‍රමය තුළ ඇති වන ප්‍රතිවිරුද්ධතා හේතුවෙන් එම ක්‍රමය උග්‍ර අර්බුදයකට මුහුණ දෙන අතර අවසානයේ නිර්ධන පංතිය විසින් මෙහෙයවනු ලබන විප්ලවය හේතුවෙන් එම ක්‍රමයේ බිඳ වැටීම සිදු වේ.

මාක්ස් මෙම මතය තහවුරු කිරීම සඳහා උපයෝගී කර ගන්නා ලද්දේ සමාජ ක්‍රම විකාශය විග්‍රහ කිරීම සඳහා ඔහු විසින් යොදා ගනු ලැබූ ද්විඝටනාත්මක භෞතික වාදයයි. එම න්‍යාය ඔස්සේ මාක්ස් පැහැදිලි කළේ ප්‍රවාදය, (Theisis) ප්‍රතිවාදය,(Anti theisis) සහ සහවාදය (Syntheisis) යන න්‍යාමයන් ඔස්සේ සමාජීය විකාශය සිදු වන්නේය යන්නයි. ආදිකල්පිත කොමියුනිස්ට් සමාජයේ සිට ධනවාදී ක්‍රමය දක්වා වූ සමාජ විකාශණයේ දී ඉහත කී මූලධර්ම ඔස්සේ වෙනස් වීම් සිදු වී තිබේ. ඒ අනුව ධනවාදී අර්ථ ක්‍රමය ද එහි ම නිෂ්පාදනයක් වූ කම්කරු පංති සමඟ ගැටෙන අතර අවසානයේදී නිෂ්පාදන සම්පත් රජයට හිමි වන නිර්ධ පංතියේ ආඥාදායකත්වයකින් යුත් රජයක් බිහි වේ. එහි නිෂ්පාදන තීරණ ගැනීමේ සාධකය සමාජ සුභසාධනය බවට පත්වන අතර ලාභයට හෝ ශ්‍රම අතිරික්තයට ඉඩක් නොලැබේ.

**මාක්ස් සහ ඇඩම් ස්මිත්**

1776 ඇඩම් ස්මිත් විසින් ජාතීන්ගේ ධනය (An Inquiry into the Nature and Causes of the Wealth of Nations) කෘතිය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු ධනවාදී ආර්ථික චින්තන ක්‍රමය මුල්බැස ගත් අතර දශක කීපයක් යනතුරුම ඔහුගේ ආර්ථික විග්‍රහයට අභියෝග කළ හැකි න්‍යායාත්මක වූ මතවාද ආර්ථික ලෝකයට එකතු

නොවිය. (Smith,Adams,1776) ඇඩම් ස්මිත් කිසිදු ආකාරයක රාජ්‍ය මැදිහත්වීමකට තමන්ගේ ආර්ථික විග්‍රහය තුළ ඉඩ ලබා නොදුන් අතර ආර්ථික සමෘද්ධිය ලබා ගැනීමට ඉඩ සැලසෙන්නේ නිෂ්පාදන සාධක පුද්ගලික අයිතිය යටතේ පැවතීම නිසා පමණක් බව අවධාරණය කළේයි. සමාජය තුළ එක් එක් පුද්ගලයා විසින් ආර්ථිකයට කෙරෙන දායකත්වය මත සමස්ත ආර්ථික ක්‍රියාවලියේ වෙනස්කම් ඇතිවේ. සමාජය තුළ ඇති කෙරෙන වෙනස්කම් මිස්සේ පුද්ගලයාගේ අභිවෘද්ධිය ඇතිකළ නොහැකි වන්නේ පුද්ගලයා නිරන්තරයෙන්ම ස්වාර්ථය පිළිබඳ පමණක් කල්පනා කරන බැවිණි. නිෂ්පාදන සාධක පුද්ගලික අයිතිය යටතේ පැවතීම තරගකාරීත්වයට ද ඉන් ප්‍රශස්ථ නිෂ්පාදන මට්ටම තුළ පිරිවැය අවම වීම කෙරෙහි ද සෘජුව බලපාන බව ඔහු විසින් පෙන්වා දෙනු ලැබීය.

ප්‍රාග්ධනය සහ ලාභය යන සංකල්ප පිළිබඳව ඇඩම් ස්මිත් දරණ ආකල්පය වූයේ ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය ඇතිකර ගැනීම සඳහා පොළඹවන ප්‍රධාන සාධකය වන්නේ ලාභය බවත්, ලාභ ලබාගැනීම සඳහා ප්‍රාග්ධනය මූලික සාධකයක් වන බවත්ය. ප්‍රාග්ධනය සහ ලාභය ඇඩම් ස්මිත්ගේ ආර්ථික ක්‍රමය තුළ විශාල කාර්ය භාරයක් ඉටු කිරීමට නියමිත වූ මූලික සාධකය බවට පත්ව තිබුණි. කාල් මාක්ස් කොමියුනිස්ට් ප්‍රකාශනය සහ Das Capital මගින් ඇඩම් ස්මිත්ගේ ජාතීන්ගේ ධනය කෘතියට අභියෝග කිහිපයකට පසුව වෙනත් අන්තයේ ආර්ථික දර්ශනයක් ඉදිරිපත් කරන ලදී. ඔහු ප්‍රකාශ කළේ මිනිසාගේ ආර්ථික සමෘද්ධිය ලඟා කර ගත හැක්කේ ආර්ථිකයේ නිෂ්පාදන සාධක සම්පූර්ණයෙන් ම රජය යටතේ පවත්වාගෙන යෑමෙන් බවයි (රුද්‍රිගු, (අනු) ,2002). පුද්ගලික අයිතිය තුලින් කම්කරුවන් සූරාකෑම මගින් ධනපතියන් විසින් ලාභ රැස්කරන බව පෙන්වා දෙන මාක්ස් කම්කරු ශ්‍රමයට නියමිත වටිනාකම ලබාගත හැක්කේ රාජ්‍ය ආර්ථික ක්‍රමයකින් බව පෙන්වා දුන්නේය.

නිර්ධන පංති ආඥාදායකත්වයක් යටතේ ක්‍රියාත්මක වන රජයන් විසින් ආර්ථිකය තුළ පවතින නිෂ්පාදන සාධකවලින් වැඩි ප්‍රමාණයක් අයිති කර ගන්නා අතර අනෙකුත් නිෂ්පාදන සාධක පාලනය කිරීම සඳහා ද ශක්තියක් ලබාගෙන සිටී. මධ්‍යම සැලසුම්ගත ක්‍රමයක් යටතේ නිෂ්පාදනය කළ යුතු භාණ්ඩ, නිෂ්පාදිත ප්‍රමාණය, නිෂ්පාදන සාධක, නිෂ්පාදනය කළ යුත්තේ කා සඳහා ද ආදිය තීරණය කරනු ලබයි. මේ ආකාරයට එක් අතකින් ඇඩම් ස්මිත් පූර්ණ වෙළෙඳපොල ආර්ථික ක්‍රමයක් අර්ථ දක්වද්දී මාක්ස් විසින් පූර්ණ රාජ්‍ය අර්ථ ක්‍රමයක් පිළිබඳව අදහස් දක්වා තිබේ. ඇඩම් ස්මිත්ගේ ආර්ථික විග්‍රහය පූර්ණ රාජ්‍ය නිර්බාධ ආර්ථික ක්‍රමයක් ලෙස හැඳින්විය හැකි නම් මාක්ස්ගේ ආර්ථික විග්‍රහය හැඳින්විය හැක්කේ පූර්ණ රාජ්‍ය ආර්ථික ක්‍රමයක් ලෙස ය.

මාක්ස් සහ කේන්ස්

ඇඩම් ස්මිත්ගේ රාජ්‍ය නිර්බාධ ආර්ථිකය එක් අන්තයකත්

මාක්ස්ගේ පූර්ණ රාජ්‍ය ආර්ථිකය තවත් අන්තයකත් පැවතියද එම අන්ත දෙකෙන්ම සමාජ ආර්ථික ගැටළුවලට විසඳුම් ලබා දීමට නොහැකි වූ අවස්ථාවලදී මෙම අන්ත දෙක අතරමැදි පිළිවෙතක් සොයා යාමට ආර්ථික විද්‍යාඥයන්ට සිදු විය. 1920 ගණන් වලදී බටහිර රටවල ඇති වූ මහා ආර්ථික අවපාතය (Great Economic Depression) සහ දැඩි විරැකියාව යන ගැටළුවලට විසඳුම් ලබා දීමට රාජ්‍ය නිර්බාධවාදය සමත් නොවන බව ධනවාදී ආර්ථික විද්‍යාඥයන්ට අවබෝධ විය. ඒ නිසා රාජ්‍ය නිර්බාධවාදයෙන් බැහැර වූ මාවතක් අනුගමනය කිරීම කෙරෙහි ඔවුනු උනන්දුවක් දැක්වූහ. මාක්ස්ගේ ආර්ථික න්‍යාය මගින් පැහැදිලි වූයේ රාජ්‍ය මැදිහත් වීම අවශ්‍ය සීමාව දක්වා පවත්වාගෙන යෑම අනුමත කළ හැකි බවයි. මාක්ස්ගේ ආර්ථික න්‍යාය මෙම යුගයේදී බටහිර රටවල දැඩි බලපෑමක් ඇති කළ ආර්ථික විග්‍රහයක් බවට පත්ව තිබුණ නිසාත් 1917 ඔක්තෝබර් විප්ලවයෙන් පසු රුසියාව තුළ පූර්ණ රාජ්‍ය ආර්ථික ක්‍රමයක් බිහිව තිබීම නිසාත් රාජ්‍ය මැදිහත්වීම ධනවාදී ආර්ථික ක්‍රමයක අනුගමනය කළහැකිය යන ආකල්පය එම ආර්ථික විද්‍යාඥයන් තුළ ඇති විය. (මෙන්චේදියෙන්,සේනාසිංහ,රන්ජන දේවමිත්‍ර (පරි.) මේ නිසා කේන්ස්ට තම විග්‍රහය සඳහා මාක්ස්ගේ ආර්ථික විශ්ලේෂණය තුළින් යම් යම් කරුණු උකහා ගැනීමට අවස්ථාවක් සැලසුණි.

කේන්ස් තමන්ගේ ආර්ථික විග්‍රහය තුළින් ප්‍රකාශ කරන ලද්දේ සම්ප්‍රදායික ආර්ථික විද්‍යාඥයන් ප්‍රකාශ කළ ආකාරයට ස්වයංක්‍රීයව පූර්ණ සමතුලිතතා මට්ටමක් ඇති නොවන බවයි. පූර්ණ සමතුලිතතා මට්ටමට අඩු මට්ටමක දී ආර්ථිකයක් සමතුලිත විය හැකි බව ද ඔහු විසින් පෙන්වා දෙනු ලැබිය. පූර්ණ සමතුලිතතා මට්ටමට පහළ අවස්ථාවල දී ආර්ථිකයක් සමතුලිත වන විට සේවා වියුක්තිය උග්‍ර තත්ත්වයකට පත් වේ. ආර්ථිකය තුළ සමාහාර ඉල්ලුම වැඩි කිරීම මගින් සමතුලිතතා මට්ටම ඉහළ නැංවිය හැකිය. මේ සඳහා ඔහු යෝජනා කළේ රජය මැදිහත් වී ආර්ථිකයේ සමාහාර ඉල්ලුම වැඩිකළ යුතුය යන්නයි. රාජ්‍ය අයවැය සහ ආයෝජන ක්‍රියාමාර්ග මේ සඳහා උපයෝගී කරගත හැකි ය. පූර්ණ රාජ්‍ය නිර්බාධවාදයේ සිට තරමක රාජ්‍ය මැදිහත්වීම දක්වා ධනවාදී ආර්ථික ක්‍රමයේ ඇති වූ විකාශය කෙරෙහි නියත වශයෙන්ම මාක්ස්ගේ ආර්ථික විග්‍රහයෙන් බලපෑමක් ඇති වූ බව පෙන්වා දිය හැකිය. කේන්ස්ගේ ආර්ථික විග්‍රහය ප්‍රකාශයට පත්වීමෙන් පසු ධනවාදී රටවල් අතරම රාජ්‍ය මැදිහත්වීම ආර්ථික ක්‍රමෝපායක් වශයෙන් භාවිතා වන අතර සංවර්ධනය වෙමින් පවත්නා රටවල මිශ්‍ර ආර්ථික ක්‍රම ඇති වීම කෙරෙහි එය බලපෑවේය.

### ආර්ථික චින්තනය උදෙසා මාක්ස්වාදයේ දායකත්වය

කාල් මාක්ස් ධනවාදී ආර්ථික විග්‍රහය වෙනුවට සමාජවාදී ආර්ථික න්‍යාය ඉදිරිපත් කළා පමණක් නොව, ධනවාදී ආර්ථික ක්‍රමය වෙනුවට සමාජවාදී ආර්ථික ක්‍රමය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කළ හැකි බවද ඔහු පෙන්වා දුන්නේ ය. 1980 දශකය පමණ වන විට මුළු ලෝකයෙන් 1/3 කට වැඩි ප්‍රමාණයක් සමාජවාදී අර්ථික ක්‍රමය

ක්‍රියාත්මක වන රටවල් බවට පත්වීම මගින් ඔහුගේ ආර්ථික න්‍යායේ ප්‍රායෝගිකත්වය පැහැදිලි වේ.

1917 ඔක්තෝබර් විප්ලවය මගින් ලොව ප්‍රථම සමාජවාදී ආර්ථික ක්‍රමය රුසියාවේ බිහි කරනු ලැබීය. මෙම විප්ලවය සිදු වූ ආකාරය මෙන්ම විප්ලවයෙන් පසු රුසියාවේ බිහි වූ ආර්ථික ක්‍රමය මාක්ස්වාදය සමඟ සම්පූර්ණයෙන් ම සැසඳෙන්නේ ද යන්න පිළිබඳව ආර්ථික විද්‍යාඥයන් විවිධ මත ප්‍රකාශ කර තිබේ. එසේ වුව ද ලොව පළමු වරට මාක්ස්වාදී න්‍යාය අනුව ක්‍රියාත්මක වන ආර්ථික ක්‍රමයක් රුසියාවේ බිහි වූ බව පිළිගැනීමට හැකිය. මාක්ස්ගේ ආර්ථික විග්‍රහය ප්‍රායෝගිකත්වයට හැරවීම රුසියාවෙන් නැවතුනේ නැත. 1948 චීනයේ ද මාක්ස්වාදී ආර්ථික ක්‍රමයක් බිහි විය. මේ ප්‍රවනතාව වඩාත් දියුණු මට්ටමකට පත් වූයේ නැගෙනහිර යුරෝපයේ. නැගෙනහිර ජර්මනිය, රුමේනියාව, පෝලන්තය, යුගෝස්ලෝවියාව ,චෙකොස්ලෝවැකියාව යනාදී රටවල් ද මාක්ස්වාදී අර්ථ ක්‍රමයකට ප්‍රවිෂ්ට වීමෙන් පසුවය. ලතින් ඇමරිකාවේ කියුබාව, අප්‍රිකාවේ යේමනය ආසියාවේ වියට් නාමය, කාම්බෝජය ලාඕසිය යනාදී රටවල් ද මේ ආකාරයට සමාජවාදී ආර්ථික ක්‍රමයක් සහිත රටවල් බවට පත් විය. මාක්ස්ගේ ආර්ථික විග්‍රහය හුදු න්‍යායකට පමණක් සීමා නොවූන බව ඔහුගේ ආර්ථික චින්තන ක්‍රමය රටවල් රැසක ආර්ථික පදනම බවට පත් වීම තුළින් පැහැදිලි වේ. සමූහ නිෂ්පාදන ක්‍රමය, නිෂ්පාදන සාධක රජය සතු වීම, මධ්‍යගත සැලසුම් ක්‍රමය, කම්කරු පංති ආඥාදායකත්වය වැනි ප්‍රවේග මෙම රටවල් තුළ අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක විය. මාක්ස් ප්‍රකාශ කළ ආකාරයේ පංති විරහිත නිර්ධන පංති ඒකාධිපති ක්‍රමයක් මෙම රටවල පූර්ණ වශයෙන් ම බිහිනොවූනා විය හැකි ය. එසේ වුව ද ලොව ජනගහණයෙන් 1/3 ට ආසන්න ප්‍රමාණයක ජීවන පැවැත්ම නීරණය කරන ප්‍රධාන න්‍යාය බවට එය පත්ව තිබුණි.

නිගමනය

ඇඩම් ස්මිත්ගේ රාජ්‍ය නිර්බාධවාදය සංකල්පය ඇතුළත් "ජාතීන්ගේ ධනය" කෘතිය 1776 දී ප්‍රකාශයට පත් විය. මාක්ස්ගේ කොමියුනිස්ට් ප්‍රකාශනය කෘතිය 1848 දී ද Das Capital 1867 දී ද ප්‍රකාශයට පත් විය. ලොව එකම ආර්ථික ක්‍රමය බවට ධනවාදය පත් වීමට තිබූ ඉඩකඩ මාක්ස් විසින් ඔහුගේ කොමියුනිස්ට් ප්‍රකාශන සහ Das Capital මගින් අහුරා දැමීය. Das Capital ප්‍රායෝගිකත්වයට පත් වූයේ 1917 රුසියානු ඔක්තෝබර් විප්ලවය නිසා යැයි ප්‍රකාශ කළ හැකි ය. මාක්ස්ගේ ආර්ථික විග්‍රහයෙන් ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයට සිදු වූ සේවාව තුන් ආකාරයකින් විග්‍රහ කළ හැකිය. එනම්,

1. ධනවාදී ආර්ථික න්‍යායන්ට විකල්ප වූ න්‍යායක් ඉදිරිපත් කිරීම,
2. ධනවාදී අර්ථික න්‍යාය රාජ්‍ය මැදිහත්වීම පිළිබඳ විග්‍රහයකට ඉඩසලසා දීම සහ ඒ ඔස්සේ ධනවාදී ආර්ථික චින්තන ක්‍රමයේ සංශෝධනයකට ඉඩ සලසා දීම.

3. මාක්ස්වාදී ආර්ථික ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක වන ආර්ථිකයක් සහිත රටවල් රැසක් ඇතිවීම තුලින් එම න්‍යාය ලොව මුලු ජනගහණයෙන් 1/3 කට ආසන්න සංඛ්‍යාවක් විසින් පිළිපදිනු ලබන ප්‍රායෝගික ආර්ථික න්‍යාය බවට පරිවර්තනය වීම යනාදී කරුණු වේ.

## මූලාශ්‍ර


අබේසේකර, ගුණදාස (2000) ***දේශපාලන විචාර***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

ට්‍රොට්ස්කි, ලියොන්. (2002) විජේගුණසිංහ, පියසිලි (පරි.) ***මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා*** කම්කරු මාවත ප්‍රකාශකයෝ, කොළඹ.

නානායක්කාර, වාසුදේව සහ රත්නායක, මහින්ද (සංස්.) (2000) ***150 වසරකට පසු කොමියුනිස්ට් ප්‍රකාශන*** එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

පුරසිංහ, ටෙරන්ස්. ***රාජ්‍ය දර්ශනයේ පැතිකඩ තුනක්*** (2003) ජේ.ඇන්ඩ් ජේ. ප්‍රකාශකයෝ, නුගේගොඩ.

මෙද්වෙදියෙව්, රෝයි. සේනාසිංහ,රත්න දේවමිත්‍ර (පරි.) ***1917 රුසියානු විප්ලවය බොල්ශෙවිස්වාදීන්ගේ ජය හා පරාජය***. සූරිය ප්‍රකාශකයෝ, මරදාන.

රුළිතු, දැදිගම, වී. (අනු.) (2002) ***කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය මාක්ස් සහ එංගල්ස්***. පුරැලු පොත් ,රාජගිරිය.

වර්ණපාල, විල්වා. (2001) ***උසස් පෙළ දේශපාලන විද්‍යා ප්‍රවේශය***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන.

වර්ණපාල, විල්වා. (1995) ***දේශපාලන සිද්ධාන්ත***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

සැමුවෙල්සන්, පෝල් ඒ. සහ නෝර්ඩ්හවුස්, විලියම්. ඩී.(12 සංස්.) (1990) ***ආර්ථික විද්‍යාව***. ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු අධ්‍යාපන සංගමය, කොළඹ.

සුමිත්‍රපෙරුම, ජේ.ආර්.පී. (2001) ***දේශපාලන දර්ශන විග්‍රහය***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

හෙට්ටිආරච්චි, සිලත්. (1998) ***සමාජ විද්‍යාවිචාරණය*** සමාජ සංස්ථා, පර්යේෂණ හා ප්‍රකාශන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය.

Audi, Robert (ed.) ***The Camebridge Dictionary of Philosophy***, 2 nd edition, Cambridge University Press.

Bronfenbrenner, Martin. Sichel, Werner & Gardner, Wayland (1984) ***Macroeconomics***, Houghton Mifflin Company, Boston.

Muthiah, Wesley s. and Wanasinghe, Sydney. (ed.) (2004) ***The Case for Socialism*** :Diverse Arguments from Across the Globe

Wright, Erick Olin. Levine, Andrew. Sober, Elliott (1992) ***Reconstructing Marxism***, Verso, London.

http://www.google.com./search?=en&cq=karl+marx+and+economic+thought&btng= google+search

http://en.wikipedia.org

http://www.econlib.org